**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව - 2022**

**------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ජාතික සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ජාතික සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ජාතික සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ජාතික සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ජාතික සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ජාතික සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ජාතික සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ජාතික සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ජාතික සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ජාතික සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 21(ඉ) අනුව අස්ථිත්වයක අනුමත කළ අයවැය ලේඛනයක් නිකුත්කර ඇත්නම් අතිරේක මූල්‍ය ප්‍රකාශනයක් වශයෙන් අයවැයගත සංඛ්‍යා සහ සත්‍ය සංඛ්‍යා අතර සංසන්දනයක් හෝ මූල්‍ය ප්‍රකාශන වල අයවැයගත සංඛ්‍යාවන් වෙනම තීරුවක් ලෙස ඉදිරිපත් කළයුතු වුවත්, අනුමත ඇස්තමේන්තුවක් නොතිබුණු රු.29,268,683ක වටිනාකමින් යුතු අයිතම 08ක් අයවැයගත තොරතුරු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අයවැය ලේඛනයේ ඉදිරිපත් කර ඇති සංඛ්‍යා පමණක් මූල්‍ය ප්‍රකාශන වල අයවැයගත සංඛ්‍යා ලෙස දැක්වීමට කටයුතු කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ඇස්තමේන්තුගත අයිතම පමණක් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කල යුතුය |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11න් හඳුන්වා දී ඇති විකල්ප ගිණුම් තැබීමේ ක්‍රමවේදය අනුව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි. එමෙන්ම වර්ෂය තුල ලැබුණු සියළුම ප්‍රාග්ධන ප්‍රදාන ,හුවමාරු නොවන ගනුදෙනුවලින් ජනිත වූ අයභාර යටතේ දැක්විය යුතු වුවත් ,සමාලෝචිත වර්ෂය තුල රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබී තිබුණු රු.3,038,000 කින් රු.1,256,094ක් අයභාර ලෙස හඳුනා නොගැනීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය සහ රජයේ ප්‍රාග්ධන ප්‍රදාන රු.1,256,094කින් පිළිවෙලින් අඩුවෙන් සහ වැඩියෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේදී නිවැරදිව ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීමට එකඟ වන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව රජයේ ප්‍රදාන ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ සඳහා හඳුනාගත යුතු ක්ෂය වියදම රු.2,052,637ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය වියදම ලෙස රු.1,843,867ක් දැක්වීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා මෝටර් රථ ගිණුමේ ශේෂය රු.208,770කින් පිළිවෙලින් අඩුවෙන් සහ වැඩියෙන් දක්වා තිබුණි. | මෝටර්රථ ගිණුම 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට එකඟ වන බව. | ක්ෂය වියදම නිවැරදිව ගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | පරිගණක උපාංග සඳහා සමාලෝචිත වර්ෂය ආරම්භයේ සිට ප්‍රත්‍යාගණිත දිනය දක්වා හඳුනාගත යුතු ක්ෂය වියදම රු.98,019ක් වුවත් එය මූල්‍ය ප්‍රකාශන තුල රු.167,581ක් ලෙස හඳුනාගැනීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය සහ ප්‍රත්‍යාගණන අතිරික්තය රු.69,562ක් වැඩියෙන් දක්වා තිබුණි. | පරිගණක උපාංග ගිණුම 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට එකඟ වන බව. | ක්ෂය වියදම නිවැරදිව ගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනයේදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් නොවන රු.541,933ක් වියදම් අඩි වෙන් කිරීම් ලෙස වර්ෂයේ අතිරික්තයට ගලපා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදි කිරීමට එකඟ වන බව. | මූල්‍ය ප්‍රකශන වල සත්‍ය අගයන් පමණක් දැක්වීමට වගබලා ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා තොග ගිණුමේ ආරම්භක ශේෂය වූ රු.1,080,696ක්, ලිපිද්‍රව්‍ය වියදම් ගිණුමට ප්‍රමාද දෝෂයකින් රු.180,696ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා අවසාන තොගයේ වටිනාකම රු.900,000කින් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි. | ලිපි ද්‍රව්‍ය ගිණුම නිවැරදි කිරීමට උපදෙස් දෙන ලද බව. | මූල්‍ය ප්‍රකශන පිළියෙල කිරීමට පෙර ලෙජර් ගිණුම් වල දැක්වෙන ශේෂයන්ගේ නිවැරදිතාවය තහවුරු කල යුතුය. |
| (ඉ) | 2021 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අතිරික්ත ගිණුමේ සහ විලම්භිත රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ශේෂය පිළිවෙලින් රු.267,254 ක් හා රු.9,297,497 ක් වුවත් 2022 වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස සමුච්චිත අතිරික්ත ගිණුමේ රු.508,294 ක් හරට හා විලම්භිත රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට රු.10,073,045 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් එම වටිනාකම්හි නිවැරදිභාවය තහවුරු කිරීමට විගණනයේදී නොහැකි විය. | සමුච්චිත අතිරික්තය ගිණුම හා විලම්භිත රජයේ ප්‍රාග්ධන ගිණුම 2023 වර්ෂයේදී නිවැරදි කරන ලෙස උපදෙස් දෙන ලද බව. | වර්ෂය අවසාන ශේෂ, ඊලඟ වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස පිටපත් කිරීමේදී නිවැරදිව සටහන් කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2022 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කරන ලද මෝටර් රථවල ක්ෂය වියදම රු.831,123 ක් මූල්‍ය ප්‍රකාශනයන්හි ක්ෂය වියදම ලෙස හඳුනාගෙන තිබියදී දෝෂ සහගත ලෙස නැවත එම අගය වර්ෂයේ ආදායමට හා විලම්භීත ආදායම් ගිණුමේ සටහන් කිරීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය සහ විලම්බිත ආදායම් ප්‍රදාන එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මෝටර් රථ ක්ෂය නිවැරදිව කරන ලෙස උපදෙස් දෙන ලද බව. | ක්ෂය නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | ඉකුත් වර්ෂ වලදී භාණ්ඩ සමීක්ෂණවලින් හඳුනාගෙන ඉවත් කරන ලද පිරිවැය රු.569,973ක් වූ පරිගණක උපාංග සමාලෝචිත වර්ෂයේදී පොත් වලින් කපා හැරීමේදී වත්කම් වල සමුච්චිත ක්ෂයවීම් වත්කම් ලියාහැරීමේ ගිණුමට මාරු නොකර වත්කම් ප්‍රත්‍යාගණන ගිණුමට මාරු කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය සහ ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | සාක්ෂි සොයා බලා විගණනයට ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලද බව. | වත්කම් පොත් වලින් කපා හැරීමේදී වත්කම් වල සමුච්චිත ක්ෂයවීම් වත්කම් ලියාහැරීමේ ගිණුමට මාරු කළ යුතුය. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| පරිගණක උපකරණ ගිණුම් ශේෂය | 5,698,339 | 5,380,568 | 317,771 | පරිගණක ප්‍රත්‍යාගණන ගිණුම 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට එකඟ වන බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි නිවැරදි බව පිළිබඳව සැලකිළිමත් විය යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2023 ජනවාරි 27 දිනැති අංක 2023/01 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 02(viii) ඡේදය මගින් සංශෝධිත 2022 අප්‍රේල් 26 දිනැති අංක 2022/03 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3(x) ඡේදය | රජයේ අත්තිකාරම් ගිණුම් යටතේ මාණ්ඩලික නිලධාරීන් වෙත ලබාදෙනු ලබන ණය පහසුකම් අත්හිටුවා තිබුණත් ඊට අනුකූල නොවන ලෙස සභාවේ සේවයේ නියුතු මාණ්ඩලික නිලධාරීන් 3 දෙනෙකු සහ 7දෙනෙකු වෙත පිළිවෙලින් ආපදා ණය වශයෙන් රු.403,000ක් සහ උත්සව අත්තිකාරම් වශයෙන් රු.70,000ක් ගෙවා තිබුණි. | ඉදිරියේදී චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරන බව. | පවතින නීති රීති වලට අනුකූලව කටයුතු කිරීමට අවධානය යොමු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.550,915 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,193,977 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,744,892 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව රජයේ ප්‍රදාන රු.1,787,755 කින් වැඩි වී තිබුණද ඊට සාපේක්ෂව මුළු වියදම රු.4,063,630 කින් වැඩි වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේ සිට සභාව විසින් විදේශ පුහුණු වැඩසටහන් පැවැත්වීමෙන් ජනනය වූ රු.14,329,816ක අතිරික්තය ඵලදායී ලෙස ආයෝජනය නොකර 2022 ජනවාරි 01 දිනට සභාව නමින් රජයේ බැංකුවක ජංගම ගිණුම තුල පැවතීමෙන් 2022 වර්ෂයේදී පමණක් අවම වශයෙන් රු.788,140ක පොලී ආදායමක් අහිමි වී තිබුණි. | පාලක මණ්ඩල රැස්වීමේදී ගන්නා ලද තීරණයක් අනුව දැනට ස්ථාවර තැන්පතු ගිණුම විවෘත කර ඇති බව. | බැංකු ජංගම ගිණුමේ පවතින අතිරික්ත මුදල් ඵලදායි ලෙස ආයෝජනය කිරීමට කටයුතු කල යුතුය |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ පනතේ 14 (1) වගන්තිය අනුව ජාතික මානව සම්පත් සංවර්ධනය කිරීමේ ප්‍රතිපත්තියක් සකස් කිරීම හා එය කාලීනව සමාලෝචනය කිරීම, මානව සම්පත් සංවර්ධනය පිළිබඳ අමාත්‍යවරයාට හා රජයට උපදෙස් ලබාදීම සිදු කල යුතු වුවත් ආයතනය පිහිටුවා වසර 25 ක් ගත වී ඇතත් ජාතික සභාව පිහිටුවීමේ ඉහත මූලික අරමුණු සාක්ෂාත් කර ගැනීමට 2022 දෙසැම්බර් 31 දින වන විටත් අපොහොසත් වී තිබුණි. | සංශෝධිතව සකස් කරන ලද මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය සඳහා 2017 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇති බව.<br>වර්තමාන අවශ්‍යතාවට අනුකූල වන පරිදි මෙම ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම සඳහා සැලසුම් කර ඇති බව. | ප්‍රධාන අරමුණ ඉටුකිරීම සඳහා ඵලදායි ක්‍රියාමාර්ග ගනිමින් ආයතනය පිහිටුවීමේ අරමුණු සාක්ෂාත් කරගත යුතුය. |
| (ආ) | ඉහත පනතේ 16(2)ඇ සහ 16(2)ඊ වගන්ති අනුව පහත කාර්යයන් ඉටු කිරීම. | | |

| | | |
|---|---|---|
| (i) සභාව විසින් ඉටු කරනු ලබන කර්තව්‍යවලට සමාන කර්තව්‍ය ඉටුකරන ශ්‍රී ලංකාවෙන් බැහැර පිහිටි ජාත්‍යන්තර නියෝජ්‍යායතන සහ වෙනත් සංවිධාන සමඟ සම්බන්ධතා ඇතිකරගෙන පවත්වාගෙන යාමට කටයුතු කල යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් මෙම කාර්ය ඉටුකර නොතිබුණු අතර 2022 වර්ෂය සඳහා සකස්කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම පරීක්ෂාවේ දී මේ සඳහා අවශ්‍ය ක්‍රියාකාරකම් සැලසුම් කර හෝ නොතිබුණි. | 2023.08.02 දින කලාපීය මානව සම්පත් සංවර්ධන සැලැස්ම ඩකාහි පිහිටි BIMSTEC ස්ථිර ලේකම් කාර්යාලය වෙත යොමු කල බවත්, මේ වන විට එම සැලැස්ම අදහස් හා යෝජනා සඳහා සාමාජික රටවල් වෙත යොමු කර ඇති බව. | පනතේ දක්වා තිබෙන කාර්යයන් ඉටුකිරීම කෙරෙහි මූලිකවම අවධානය යොමු කළ යුතුය. |
| (ii) ආයතනයේ මූලික අරමුණ ඉටු කර ගැනීමට උපකාරී වන මානව සම්පත් සංවර්ධනයට අදාල විවිධ ක්ෂේත්‍ර පිළිබඳව තොරතුරු ඇතුලත් දත්ත බැංකුවක් පවත්වා ගැනීම සිදු කල යුතු වුවත් 2021 වර්ෂයේදී ද දත්ත බැංකුව නිර්මාණය කිරීම සඳහා උපදේශකවරයෙකුගේ සේවය ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දැනුම්දී තිබුණද 2022 දෙසැම්බර් 31 දින වන විටත් දත්ත බැංකුවක් පවත්වා ගෙන නොතිබුණි. | මෙහිදී එකතු කරනු ලැබූ දත්ත ඇසුරින් වාර්තාවක් සම්පාදනය කර අග්‍රාමාත්‍ය කාර්යාලයට භාර දෙන ලදී. මෙහි දෙවන අදියර ලෙස ඩිජිටල් දත්ත පද්ධතියක් සම්පාදනය කිරීම සඳහා යෝජනා වුවද, ප්‍රතිපාදන ලබාගැනිමේ පවතින දුෂ්කරතා හේතුවෙන් එම අදහස ක්‍රියාවට නැංවීම අඩපණ විය. | ආයතනයේ මූලික අරමුණ ඉටු කර ගැනීමට උපකාරී වන දත්ත බැංකුවක් පවත්වා ගැනීම කෙරෙහි මූලිකවම කටයුතු කල යුතුය. |

## 3.3 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 පෙබරවාරි මාසයේ සිට සභාව විසින් භාවිතා කරනු ලබන ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය සතු තක්සේරු වටිනාකම රු.9,100,000ක් වූ කැබ් රථය 2022 දෙසැම්බර් 31 දින වන විටත් සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | වාහනයේ හිමිකාරීත්වය සභාව වෙත පවරන ලෙස කිහිපවිටක් ඉල්ලා තිබුණද ඒ සඳහා පැහැදිළි පිළිතුරක් ලබා දී නොමැත. ඉදිරියේදී මේ පිළිබඳව අදාල අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බව. | වාහනයේ හිමිකාරීත්වය පවරා ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 17 දිනැති අංක PFD/08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව සියලු රාජ්‍ය ව්‍යවසායන් 2020 ජනවාරි 31 දිනට පෙර ජාතික e-GP පද්ධතිය සඳහා ලියාපදිංචි විය යුතු බව දක්වා තිබුණද ජාතික සභාව විසින් මෙම වාර්තාවේ දිනය දක්වාම ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අදාල චක්‍රලේඛ ප්‍රකාරව e-GP පද්ධතිය තුල කඩිනමින් ලියාපදිංචි වීම සඳහා උපදෙස් දෙන ලද බව. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුව ද 2022 වර්ෂයට අදාල සභාවේ මූල්‍ය ප්‍රකාශන දින 132ක ප්‍රමාදයකින් පසුව එනම් 2023 ජූනි 12 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන විගණන හා කළමනාකරණ කමිටු අනුමැතිය සඳහා යොමු කරන ලද අතර එම රැස්වීමක් පවත්වන ලද්දේ 2023.03.30 වන දිනය. ඉන්පසු පාලක මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කරන ලදි. අනතුරුව අදාල පාලක මණ්ඩල අනුමැතිය ලද පසු විගණනය සඳහා ඉදිරිපත් කරන ලද බව. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |